

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන

## යල කන්නය 2020

# සෝයා වගාව

- වියළි කාලයේ දී අස්වනු නෙලීමට හැකිවන පරිදි බෝගය වගා කරන්න.
- අධික වර්ෂාව මෙන්ම අධික වියළි දේශගුණය බීජ පැළවීම දුර්වල කරයි.
- අක්කර 01 ක් සඳහා බීජ කිලෝ ග්‍රෑම් 20 - 22
- මාස 2 1/2 - 3 අතරදී අස්වනු නෙළාගත හැක.
- අක්කරයකින් කිලෝ ග්‍රෑම් 800-1200 ක් ලබාගත හැක.
- නිර්දේශිත ප්‍රභේදය - පි.බි. 01

**බීජ ක්ෂේත්‍රයේ සිටුවීමට පෙර ප්‍රරෝහණය පරීක්ෂා කර බලන්න. එහි ගැටළුවක් පවතී නම් බීජ ලබාගත් ස්ථානයට නොපමාව වාර්තා කරන්න.**

- වගාව පිහිටුවීම සඳහා ගැඹුරට පස පෙරලා කැට පොඩිකර, ඇලි වැටි හෝ උස් පාත්ති සකස් කර ගන්න.

**බීජ සිටුවීමට පෙර ජලය සම්පාදනය කර අමතර ජලය බැස ගිය පසු බීජ සිටුවන්න.**

- බීජ සිටුවීමේ දී බැක්ටීරියා මඟින් ප්‍රතිකාර කිරීමෙන් අස්වැන්න වැඩිවීම සහ යූරියා පොහොර යෙදීම අඩු කර ගත හැකි බැවින්, මේ සඳහා කෘෂිකර්ම උපදේශක මහතාගෙන් තාක්ෂණික උපදෙස් ලබා ගන්න.
- පසට කාබනික පොහොර යොදන්න.
- පාංශු පරීක්ෂාවකින් අනතුරුව අවශ්‍ය මූලික රසායනික පොහොර යෙදීම සිදු කිරීමට කෘෂිකර්ම උපදේශක මහතාගේ උපදෙස් ලබාගන්න.
- පේළි අතර පරතරය සෙ.මී. 40ක් ද පැළ අතර සෙ.මී. 10ක් ද වන ලෙස පාත්තියක බෝග පේළි 2-3 ලෙස හෝ කුඹුරු ඉඩම්වල ඇලි වැටි ලෙස සිටුවිය හැක.

- ඇඟිලි පුරුකක් පමණ ගැඹුරට හිලක් සාදා බීජ 02 බැගින් සිටුවන්න.

- එක ස්ථානයකට බීජ දෙකක් දමා සෙ.මී. 3 ක් පමණ යටකර පැළවීමෙන් සති දෙකකින් එකක් ඉවත් කිරීම කළ යුතුය.

- පළමු මාසය තුල දින 4 කට වරක්ද, ඉන් පසුව දින 7 කට වරක්ද ජලය සැපයීම ජලය වැඩිවීම නිසා දිලීර රෝග ඇතිවිය හැකි බැවින් පසේ තෙතමනය ගැන සැලකිලිමත් විය යුතුය.

**මල් හට ගන්න අවස්ථාවේදී අක්කරයකට කිලෝ ග්‍රෑම් 40 ක් වන ලෙස යූරියා යොදන්න.**
**(හොඳින් මුල ගැටිති වර්ධනය වී තිබේ නම් කිලෝ ග්‍රෑම් 25 ක් කෘෂිකර්ම උපදේශකවරයාගේ උපදෙස් මත)**

- හොඳින් ශාකය වර්ධනය වන තුරු දෙවරක් වල් පැළ පාලනය කරන්න. (පැළ තුනී කිරීමේ දී සහ මතුපිට පොහොර යෙදීමේ දී)

**රෝග සහ පලිබෝධ හානි පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් කෘෂිකර්ම උපදේශක මහතාගෙන් ලබා ගන්න.**

- කරල් මෝරන විට කළු පැහැයට හැරේ. වගාවෙන් 95% පමණ දුඹුරු පාටට හැරෙන විට ගස් සියල්ල එකවර කපා ගන්න.

- හොඳින් වියළා ගත් ශාක ගෝනියක දමා ලීයකින් ගසා හෝ යාන්ත්‍රිකව බීජ වෙන්කර ගන්න.

- වියළා ගත් බීජ පැය කිහිපයක් මද පවනේ තබා පිරිසුදු ගෝනිවල අසුරා වියළි සිසිල් ස්ථානයක අසුරන්න.

**වෙන් කරගත් බීජ හොඳින් වියලීම සිදුකරන්න**
**(වියළීම පරීක්ෂා කිරීම සඳහා උළු ඇටයක් සපා බැලූ විට "ටකස්" ශබ්දයෙන් දෙකඩ වී යා යුතුය)**

- ගබඩා පළිබෝධ හානි අවම කර ගැනීම සඳහා ඇසිරීමේ දී වියළි කොහොඹ කොළ හෝ දෙහි කොළ යෙදීම සුදුසුයි.

**ඔබගේ, ලබන කන්නයේ වගාවට අවශ්‍යය බීජ වෙනුවෙන් මෙම අස්වැන්නෙන් කොටසක් ආරක්ෂාකාරීව තබා ගන්න.**

*"කොරෝනා පරදමු - ආහාර අර්බුදය ජය ගනිමු"*

**සෝයා වගාව පිළිබඳව ඔබට ඇතිවන ගැටළු විසදා ගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 1920 කෘෂි උපදේශන සේවාවෙන් විමසන්න**

**කෘෂිකර්ම උපදේශක/තාක්ෂණ සහයක/මහවැලි ක්ෂේත්‍ර සහකාර**

දුරකතන අංකය

NAICC *Designed by :* NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTRE, Department of Agriculture